# උතුරු-දකුණ මිත්‍රත්ව නැ ගමන අද උදේ කොළඹින් පටන් ගනී

(ශ්‍රීතානි පෙරේරා)

සිංහල දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් ශ්‍රී ලංකා එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානය සත්හෝ ජාතික ඒකාබද්ධතා සංසදය මගින් සංවිධානය කරන 'උතුර- දකුණ මිත්‍රත්ව නැගමන' අද (13) පෙ.ව. 6.00ට කොළඹින් ආරම්භවී වන්නි ප්‍රදේශය බලා යන මෙම නැ ගමනට සිංහ සමාජ දිස්ත්‍රික් 306 ඒ සී අධිපති අජ්රොෆ් රසාක් මහතා ප්‍රමුඛ සිංහ සාමාජිකයෝ දස දෙනෙකු සහභාගි වෙති. අද (13) ඔවුන් මඩු ප්‍රදේශයේදී හෙට (14) කිලිනොච්චි ප්‍රදේශයේද නතර වීමට නියමිතය.

උතුරේත්- දකුණේත් ජනතාව අතර සුහදතාව සහ අවබෝධය ගොඩනැංවීම සඳහා, මෙම නැ ගමන යන බවත් ඉකුත් පෙබරවාරි 5-7 දිනවල ගිය පළමුවන නැ ගමනත් මාර්තු 16-18 දිනවල ගිය දෙවන නැ ගමනත් ඉතා සාර්ථක වූ බවත් කොළඹ විජේරාම, විද්‍යා මාවතේ සිංහ සමාජ මූලස්ථානයේදී ඊයේ (12) පැවති මාධ්‍ය හමුවකදී සත්හෝ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය දේශප්‍රිය එස්. විජේතුංග මහතා සඳහන් කළේය.

මෙම නැ ගමනේ ප්‍රධාන අරමුණ වන්නේ උතුර- නැගෙනහිර ජනතාව සුභ සිද්ධිය උදෙසා දකුණේ ජනතාවගේ වියදමින් උතුරු- දකුණු මිත්‍රත්වයේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා එල්ටීටීඊ සංවිධානයත් සමග සාකච්ඡා කිරීම බවද ඒ මහතා කීය.

මේ පිළිබඳව පසුගිය ගමන් වාරවලදී මූලික සාකච්ඡා සිදුකළ බවද ඒ අනුව කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට එල්ටීටීඊ සංවිධානය බොහෝ දුරට ඉඩ දිය හැකි බවද ඒ මහතා කියයි.